Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office

කලාප අධ්‍යාපන කාර්යාලය - දෙහිඕවිට

විෂය - සිංහල සාහිත්‍ය සංග්‍රහය

ඒකකය - 03

ශ්‍රේණිය - 10

සැකසුම - දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ සම්පත් දායක මඩුල්ල

# පාඩම - හානා හිය පානා අඩහැරෙන් දැනේ

1. **කෙටි පිළිතුරු ලියන්න.**
   i. ජන කවියට අනුරාධපුර යුගය දක්වා දිගු ඉතිහාසයක් ඇති බවට සාධකයක් ලියන්න.
   ii. කෙතක් රකින සිංහල කාන්තාවක් ජාති, ජරා, මරණ පිළිබඳ කී ගීයක් අසා රහත් වූ පිරිස කොපමණ ද?
   iii. ජන කවිය නිර්මාණය වීම සඳහා පාදක වූ මිනිස් සිතේ ඇතිවන භාවයන් කිහිපයක් ලියන්න.
   iv. ජපන් කවි වැඩි වශයෙන් නිර්මාණය වී ඇත්තේ කුමන කර්මාන්තයක් ඇසුරින් ද?
   v. කෘෂි කර්මාන්තය ආශ්‍රිතව බිහි වී ඇති ජනකවි මොනවා ද?
   vi. කෙළි සෙල්ලම් ඇසුරෙන් බිහි වූ ජනකවි මොනවා ද?
   vii. ගොවියා බලි තොවිල් හා ශාන්ති කර්ම යොදා ගත්තේ කුමක් සඳහා ද?
   viii. ජනකවි නිර්මාණයට පාදක වූ ජීවිතයේ විවිධ අවස්ථා පාඩමෙන් උපුටා ලියන්න.
   ix. ජන කවියෙ විශේෂ ලක්ෂණ මොනවා ද?
   x. ‘හානා හිය පානා අඬහැරෙන් දැනේ’ පද්‍ය කුමන ජනකවි වර්ගයට අයත් වේ ද?

2. **A තීරුවේ සඳහන් වචන වල තේරුම B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| i. | අමුතු බත් දීම | කඩුව |
| ii. | අඬහැරෙන් | පන්දම/ හුළු අත්ත |
| iii. | බහින දිය | ආගන්තුක සත්කාර |
| iv. | සකිය | ගලායන ජලය |
| v. | නහින දෙහින | කාන්තාවන් |
| vi. | ගොඩැල්ල | සී සෑමේදී නගන ශබ්දය |
| vii. | යක් දෙබරේ | මිතුරා |
| viii. | කග | ශක්තිය |
| ix. | මිණි බරණ | මී පැණි |
| x. | රන් විමන | වයස්ගත කාලය |
| xi. | ගිනි හුළ | බිම සාදන දෙබරය |
| xii. | ලියන් | මැණික් ආභරණ |
| xiii. | වෙර | නිස්කාරණේ |
| xiv. | නිකරුණේ | රත්රන් විමානය |
| xv. | පැණි මීය | උස් බිම් කඩ |

3. **පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.**

i. නහින දෙහින තාලෙට පින් කෙරුම යුත
වහින කලට කූරින් විල්වලින් එත
..................................................................
පනින රිළවුන්ට ඉනිමං කමක් නැත

ii. ..................................................................
..................................................................
කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් ගෙවනු

4. **පහත සඳහන් කවි පද වලින් ලබා දෙන උපදේශය කුමක් ද?**

i. 'වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ'

..............................................................................................

ii. 'තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු'

..............................................................................................

iii. 'ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද?'

..............................................................................................

iv. 'පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද ද?'

..............................................................................................

5. **පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

එක් උනදාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උනදාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළඳේ කරවිල තිබ්බටු සේමා

i. ඉහත සඳහන් කවියේ ඇති උපමා/ උපමේය වෙන්කොට ලියන්න.

..............................................................................................

ii. අනුප්‍රාසාත්මක යෙදුම් සහිත පද පේළිය උපුටා ලියන්න.

..............................................................................................

6. **'හානා හීය පානා අඩහැරෙන් දැනේ' යන පාඩමේ සඳහන් ප්‍රස්තාව පිරුළු සකස් කොට ලියන්න.**

..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................